**ර/බල/කෝංගහමන්කඩ විද්‍යාලය,බලංගොඩ.**

**පළමු වාර පරීක්ෂණය- 2021**

**සිංහල භාෂාව හා සාහිත්‍ය I,II** **පැය 2**

**නම:** **7 ශ්‍රේණිය**

## I -කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1) නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන වන්නේ,

1) 42 2) 18 3) 60 4) 10

2) නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර ගණන,

1) 10 2) 20 3) 18 4) 42

දී ඇති පදයට විරුද්ධ පදය ලියන්න.

3) සම්මාන : ..............

4) බාහිර : ..............

5) යහගුණ : ..............

දී ඇති පදයට සමාන පදය ලියන්න.

6) පොළව : ..............

7) ආවාස : ..............

පහත සඳහන් වාක්‍යවලට සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

8) වැද්දා ............. ගියේය. (වණයට,වනයට)

9) ............. අමුත්තා උත්සව සභාව ඇමතුවේය.(ප්‍රදාන,ප්‍රධාන)

10) ............. පාසලට යන්නෙහු.(තොප,නුඹලා)

පහත සඳහන් වචන යොදා අර්ථවත් වාක්‍ය ලියන්න.

11) දන : ........................................................................................................................

12) කිරණ :.....................................................................................................................

13) මහප්‍රාණ අක්ෂරයක් සහිත වචනය වන්නේ,

1) පාෂාණ 2) පන්සල 3) අඛණ්ඩ 4) ආණ්ඩු

14) සඤ්ඤක අක්ෂරයක් සහිත වචනය වන්නේ,

1) දොඩම් 2) දෙළුම් 3) අඹ 4) නාරං

පහත සඳහන් වචනවල යෙදි ඇති පිල්ලම් නිවැරදිව නම් කරන්න.

15) කොමඩු : ...........................................

16) සෘද්ධිමත් : ...........................................

17) මධ්‍යම පුරුෂ ඒක වචන නාම පදයක් වන්නේ,

1) මම 2) ඔහු 3) තෝ 4) තොපි

පහත සඳහන් වචනවල අනුක්ත පද ලියන්න.

18) මිනිසෙක් : ..............

19) ළමයා : ..............

හිස්තැනට සුදුසු වචනය යටින් ඉරක් අඳින්න.

20) සභා තුමූ සතුටින් විසිර

1) ගියේය 2) ගියාය 3) ගියහ 4) යයි

(ල.2×20=40)

## II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.**

1) කමත් භාෂාවේ යෙදෙන පහත සඳහන් වචන සඳහා පොදු ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.

1) උප්පිඩ 3) මුත්තෙට්ටුව 5) රසබෝ්ය

2) මහප්පිඩ 4) කුඹල් ගෙඩිය

1.2) කමත් භාෂාව පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(ල. 5×2= 10)

2) ලෝක ළමා දිනය වෙනුවෙන් පාසලේ පැවති ක්‍රිකට් තරඟාවලිය පිළිබඳ තොරතුරු සඳහන් කරමින් වෙනත් පාසලක සිටින ඔබගේ මිතුරෙකුට/මිතුරියකට පෞද්ගලික ලිපියක් ලියන්න.

(ල.10)

3) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

- **"ඇත්ත,ඇත්ත.ඒ වුණාට ධාන්‍ය නැතිව පාන් හදන්නේ කොහොමද?"**

1) ඉහත ප්‍රකාශය කා විසින් කාහට කියන ලද්දක් ද?

2) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?

3) එම පාඩම ඇතුළත් කෘතිය කුමක් ද?

- **"කෝපි වෙන්න ඇති.ඇයි අපි එනකොට ගෙනාවේ රතු ගඟුලනේ."**

1) මෙහි **රතු ගඟුල** ලෙස හඳුන්වන්නේ මොනවාද?

2) ඉහත ප්‍රකාශය කා විසින් කාහට කියන ලද්දක් ද?

3) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක්ද?

(ල.10)

4) ප්‍රස්ථාව පිරුළු සහ ඉඟි වැකි පිළිබඳ හඳුන්වා,ප්‍රස්ථාව පිරුළු පහක් සහ ඉඟි වැකි පහක් ලියා දක්වන්න. එහි අර්ථය කෙටියෙන් හඳුන්වන්න.

(ල.5×2=10)

5) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

1) වැලිවිට සරණංකර සංඝරාජ හිමි

2) ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව

3) මා ගිය අධ්‍යාපන චාරිකාවක්

4) සිරිත් විරිත් අගය කරන අපේ ගොවිතැන

5) අලුත් අවුරුද්ද (ල.20)